**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - 2013**

---

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1. 4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1. තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

වර්ෂ 1 සිට වර්ෂ 5 දක්වා කාලපරිච්ඡේදයකට අදාළ උපකුලපති අරමුදලින් සහ නර්ථන පීඨ සංවර්ධන අරමුදලින් විශ්වවිද්‍යාල අරමුදල වෙත ලැබිය යුතු රු.799,147 ක් වැඩිපුර ගෙවන ලද සේවක භාරකාර අරමුදල් රු.46,417 ක් සහ ගබඩා භාරකරුගෙන් අයවිය යුතු රු.67,259 ක් ඇතුළුව මුළු වටිනාකම රු.955,461 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1)වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගෙවූ රු.147,825,402 ක වැටුප් හා දීමනාවල නිවැරදිතාවය පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීමේ ලේඛන සහ නිවාඩු ලේඛන නඩත්තු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික හා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(3) හා (4) | සමාලෝචිත වර්ෂයේ අනතුරට ලක්වූ වාහන හතරක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 1994 ජූනි 14 දිනැති හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය සහ පශ්වාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය විසින් සකස් කරනු ලබන අයවැය ඇස්තමේන්තුවක් මත පිහිටා භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන මුදල් කමිටු නිර්දේශය හා පාලක සභා අනුමැතිය මත රු.614,000 ක් සහ රු.264,250 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි. |
| (ඈ) | 1994 ජූනි 14 දිනැති හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය සහ 2008 ජූනි 26 දිනැති අංක | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය වන පීඨාධිපතිවරුන්, මූල්‍යාධිකාරී සහ පුස්තකාලයාධිකාරී සඳහා කාර්යාලයේ සිට නිවස දක්වා ප්‍රවාහන පහසුකම් |

| | | |
|---|---|---|
| | 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සැපයීම වෙනුවට මාසිකව එක් අයෙකුට රු.30,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලබන අතර, සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 05 දෙනෙකුට චක්‍රලේඛයන්ගෙන් බැහැරව රු.1,694,516 ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. |
| (ඉ) | 2003 ජූනි 02 දිනැති පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය | විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් සම්බන්ධයෙන් 1984 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂික සමීක්ෂණයන් සිදුකර නොතිබුණි. |
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම් එකතු කිරීම් උපලේඛනය හා ස්ථාවර වත්කම් ලේඛනය සැසඳීමේදී රු.8,611,522 ක වෙනසක් නිරීක්ෂණය විය. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

උපකුලපතිවරයාගේ ගමන් වියදම්, උපකුලපතිවරුන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ සංසදය (CVCD) සඳහා වූ වියදම් සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ ප්‍රධාන සම්බන්ධීකාරක හා පරිශ්‍ර පාලක වෙත දුරකථන වියදම් වශයෙන් මුළු වියදම් රු.348,051 ක් ප්‍රමාණවත් අධිකාරි බලයකින් තොරව ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3. 1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය, රු.18,668,242 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,322,560 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.25,990,802 කින් මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම සඳහා පෞද්ගලික පඩිනඩි රු. 61,104,977 කින් හා ගිවිසුම්ගත සේවා සහ වෙනත් මෙහෙයුම් වියදම් රු. 23,334,680 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) අධ්‍යයන කාර්යසාධනය**

අධ්‍යයන කාර්යසාධනය පිළිබඳ විගණනයට ඉදිරිපත් කළ තොරතුරු වාර්තාවට අනුව විශ්වවිද්‍යාලයීය පීඨ තුනෙහි ශිෂ්‍ය ලියාපදිංචිය හා ඒ ඒ වර්ෂවල අවසන් විභාග සමත්වීම පිළිබඳ අධ්‍යයන වර්ෂ 05 කට අදාල සාරාංශ ගත තොරතුරු පහත පරිදි විය.

| අධ්‍යයන | නර්තන හා නාට්‍ය කලා පීඨය | | | | සංගීත පීඨය | | | | දෘශ්‍ය කලා පීඨය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | සමත් ප්‍රතිශය |
| 2007/2008 | 332 | 329 | 312 | 95 | 321 | 328 | 281 | 85 | 109 | 108 | 105 | 97 |
| 2008/2009 | 346 | 360 | 330 | 92 | 268 | 317 | 239 | 75 | 112 | 120 | 118 | 98 |
| 2009/2010 | 188 | 209 | 204 | 98 | 161 | 187 | 172 | 92 | 53 | 53 | 52 | 98 |
| 2010/2011 | 187 | 195 | 184 | 94 | 131 | 155 | 150 | 97 | 52 | 55 | 52 | 95 |
| 2011/2012 | 182 | 188 | 182 | 97 | 137 | 145 | 133 | 92 | 62 | 63 | 62 | 98 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අධ්‍යයන වර්ෂ 04 ට අදාලව නර්තන හා නාට්‍ය කලා සහ දෘශ්‍ය කලා පීඨවලට සාපේක්ෂව සංගීත පීඨයේ විභාග සමත්වීමේ ප්‍රතිශතය පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

(ii) 2011 / 2012 අධ්‍යයන වර්ෂයෙහි විභාග ප්‍රතිඵල 2014 ජූනි 03 දින වන විටත් නිකුත් කර නොතිබුණි.

**(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය**

විශ්වවිද්‍යාලයේ පසුගිය වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.221,110 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එය රු.256,779 ක් විය. ඒ අනුව ඒක ශිෂ්‍ය පිරිවැය සියයට 16 කින් වැඩි වී තිබුණි.

**(ඇ) පර්යේෂණ දීමනා ගෙවීම**

2011 අප්‍රියෙල් 07 දිනැති අංක 45 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාර පර්යේෂණ දීමනා ගෙවීම සඳහා 2013 වර්ෂය වෙනුවෙන් රු. 15,539,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර , පීඨ තුනෙහි ආචාර්යවරුන් හා පුස්තකාල නිලධාරීන් ඇතුළු 101 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ දීමනා වශයෙන් රු.18,371,618 ක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i) නර්තන හා නාට්‍ය කලා පීඨය**

නර්තන හා නාට්‍ය කලා පීඨයේ පර්යේෂණ දීමනා සඳහා හිමිකම් ලැබූ ආචාර්යවරුන් 42 ක් අතරින් 2013 වසරේ තම පර්යේෂණයන් නිමකළ ආචාර්යවරුන් හත් දෙනෙකු පමණක් අවසන් පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කර තිබූ අතර පර්යේෂණ නිමකළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිදෙනෙකු හා ආධුනික කථිකාචාර්යවරුන් තිදෙනෙකු විගණන දිනය දක්වා අවසන් වාර්තාව ලබා දී නොතිබුණි. ඉතිරි

කථිකාචාර්යවරු 29 දෙනෙකුගෙන් සමාලෝචිත වසරට අදාලව ප්‍රගතිය ලබා නොදුන් ආචාර්යවරුන් සංඛ්‍යාව තිදෙනෙකු විය.

**(ii)** **සංගීත කලා පීඨය**

--------------------

මෙම පීඨයේ 2011 වසරට අදාල වූ කෙරීගෙන යන පර්යේෂණ කටයුතුවල සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රගතිය කථිකාචාර්යවරුන් 03 දෙනෙකු විසින් ඉදිරිපත් කර නොතිබූ අතර ආධුනික කථිකාචාර්යවරයෙක් 2011 , 2012 සහ 2013 වර්ෂයන් වලට අදාලව පර්යේෂණයන්හි ප්‍රගතිය 2014 මාර්තු 31 දින දක්වාම ඉදිරිපත් කර නොතිබුණි.

**(iii)** **දෘශ්‍ය කලා පීඨය**

-------------------

දෘශ්‍ය කලා පීඨයේ 2011 වර්ෂයේ සිට කෙරීගෙන යන පර්යේෂණයන්හි සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රගතිය ලබා නොදුන් ආචාර්යවරුන් සංඛ්‍යාව 04 ක් වන අතර, විගණිත දින දක්වා කිසිදු පර්යේෂණ ප්‍රගතියක් ඉදිරිපත් නොකල ආචාර්යවරුන් සංඛ්‍යාව තිදෙනෙක් විය.

**(ඇ)** **පර්යේෂණ පරිසංවාද**

----------------------

(i) 2013 වර්ෂයේ නොවැම්බර් 27 හා 28 යන දෙදින පවත්වා තිබූ පර්යේෂණ පරිසංවාදය සඳහා පීඨ තුනෙන්ම පර්යේෂණ සංක්ෂිප්තයන් (Research Abstracts) ඉදිරිපත් කර තිබුණේ ආචාර්යවරු 16 දෙනෙකු පමණි.

(ii) විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීමට අදාල නිර්ණායකයන්වලට අනුව පර්යේෂණ නිර්ණායකයන් වැදගත් වන අතර ඉහත නිරීක්ෂණය අනුව පර්යේෂණ සඳහා යොමුවීම හා කැපවීම පහළ මට්ටමක පවතින බව පෙනී යයි. එබැවින් 2013 ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 16,071 වන ස්ථානයේ පසු වන බව නිරීක්ෂණය විය.

**4.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 2,117,041,000 ක් වූ ඉඩම් 06 ක් සම්බන්ධයෙන් අයිතිය මෙතෙක් පවරා ගෙන නොතිබුණි.

(ආ) පුස්තකාලයෙන් බැහැරට දී ඇති මෙතෙක් ආපසු භාර නොදුන් වටිනාකම රු.210,733 ක් වූ පොත් 382 ක් පැවතිණි.

(ඇ) 2011/2012 නාට්‍ය කලාව පිළිබඳ සාමාන්‍ය උපාධියේ ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වූ දිනවලදී එකම මහාචාර්යවරයාට පරීක්ෂකවරයෙකු සහ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු. 20,000 ක සහ රු. 36,000 ක දීමනාවන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඈ) ශිෂ්‍යත්ව පිරිනැමීම අරමුණු කරගෙන බාහිර පාර්ශවයන් විසින් කරන ලද පරිත්‍යාග මඟින් පිහිටුවාගෙන තිබූ අරමුදල් 08 කට අදාලව එකතුව රු. 300,250 ක මුදල හා එහි පොළී ආදායම වූ රු.383,452 ක් අදාළ කාර්යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ද උපයෝජනය කර නොතිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 අගෝස්තු 08 දිනැති අංක 228 දරන බදු ගිවිසුමට අනුව මාසික බදු මුදල රු.60,000 ක් වූ උපකුලපති නිල නිවසේ බදු කාලය 2011 නොවැම්බර් 01 සිට 2014 ඔක්තෝබර් 30 දින දක්වා වුවද,හේතුවක් නොදන්වා නිල නිවසෙහි බදු කාලය 2013 මාර්තු 31 දිනට කලින් අවසන් කරමින් උපකුලපතිවරයා තම පෞද්ගලික නිවසෙහි පදිංචි වී ඇති අතර එම නිවස සඳහා සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා උපකුලපතිවරයාගේ නමින් වූ විදුලිය බිල්පත් වෙනුවෙන් රු.81,232 ක මුදලක් ද වෙනත් අයෙකුගේ නමින් වූ ජලය හා විදුලිය බිල්පත් වෙනුවෙන් රු.147,629 ක් ද විශ්වවිද්‍යාලය මඟින් ගෙවා තිබුණි.

(ආ) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ කම්කරු ශ්‍රේණියේ සේවිකාවක් සමාලෝචිත වර්ෂයේ මැයි සිට දෙසැම්බර් මාසය දක්වා උපකුලපතිගේ පෞද්ගලික නිවසෙහි සේවය සඳහා යොදවා ගෙන මාසයකට රු.23,846 බැගින් රු.143,814 ක් සහ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙනුවෙන්ද රු.22,991 ක දායක මුදල්ද විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි.

### 4.4 ආර්ථික නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 අප්‍රේල් 25 දින සිදුකරන ලද භෞතික සත්‍යාපනයේදී විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.399,115 ක් වැය කර නිෂ්පාදිත ඉඳුවර නම් වූ සංගත තැටි 919 ක් ගබඩාවෙහි තොග පොත්වල ඇතුළත් කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර විගණිත දින වන විටත් අලෙවි කිරීමකින් තොරව පැවතීම නිසා ඒ වෙනුවෙන් දරන ලද වියදම ආර්ථික නොවන වියදමක් බව නිරීක්ෂණය විය.

(ආ) විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විනයාරක්ෂක නිලධාරී තනතුර සඳහා පුරප්පාඩු පිරවීමට පුවත්පත් දැන්වීම් 04 ක් සඳහා රු. 99,552 ක් වියදම් කර තිබූ අතර වර්ෂයකට අධික කාලයක් ගතවී ඇතත් මෙම තනතුරු පිරවීමට වගකිව යුතු නිලධාරීන් මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) ආරක්ෂක නිලධාරීන් ස්ථානගත කිරීමේ මූලික සැළැස්මක් සකස් නොකර අභ්‍යන්තර ආරක්ෂක සේවය සඳහා කලින් සිටි 06 දෙනෙකුට අමතරව 2013 වසරේ ආරක්ෂක පරීක්ෂකවරයෙකු හා ආරක්ෂක නියාමක නිලධාරීන් අටදෙනෙකුද අලුතින් බඳවා ගෙන තිබූ අතර ස්ථිර ආරක්ෂක නිලධාරීන් 15 දෙනෙකු සඳහා රු.3,563,559 ක වැටුප් හා දීමනා සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. එසේ අභ්‍යන්තර ආරක්ෂක සේවයක් පැවතියද සමාලෝචිත වර්ෂයේ ගිවිසුම් ගත ආරක්ෂක සේවය සඳහා රු. 23,514,350 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

### 4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරුණු ලැබේ.

(අ) නේවාසිකාගාර ඉදිකිරීම් ව්‍යාපෘතිය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2011 මැයි 10 දින ආරම්භ කරන ලද දෙහිවල පිරිමි නේවාසිකාගාර ව්‍යාපෘතිය 2013 දෙසැම්බර් 27 දින තෙක් දීර්ඝ කිරීම් ලබාදී තිබුණද 2014 අප්‍රේල් 24 වන විගණන

දින වන විටද නිමකර නොතිබුණි. 2013 දෙසැම්බර් 31 වන විට මූල්‍ය කාර්ය සාධනය සියයට 48.23 ක් ද, භෞතික කාර්ය සාධනය සියයට 60 ක්ද විය.

(ii) රාජගිරිය කාන්තා නේවාසිකාගාර ඉදිකිරීම් ව්‍යාපෘතිය 2011 මැයි 12 වන දින ගිවිසුම් අත්සන් කර තිබූ අතර කැලැන්ඩර් දින 540 කින් වැඩ නිමකළ යුතුව තිබුණි. නැවතත් 2014 ජනවාරි 23 දින දක්වා දින දීර්ඝ කර තිබුණද, 2014 අප්‍රේල් 24 දින වන විටත් වැඩ නිමකර නොතිබුණි.

සමාලෝචිත වර්ෂය අවසානයේ මෙම ව්‍යාපෘතියේ මූල්‍ය කාර්ය සාධනය සියයට 31.9 ක් හා භෞතික කාර්ය සාධනය සියයට 70 ක් විය. මේ අනුව දැනට මෙම ව්‍යාපෘතිය වසර 1 ½ කට ආසන්න කාලයක් ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී නේවාසිකාගාර බදු කුළී වෙනුවෙන් රු.15,901,946 ක මුදලක් වැය කිරීමට සිදුවී තිබුණි.

(ආ) පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. මිලියන 94.65 ක ඇස්තමේන්තුවක් යටතේ 2012 ජනවාරි 14 දින ආරම්භ කර 2013 ජනවාරි 14 දින නිමකල යුතුව තිබුණද විවිධ හේතු මත ප්‍රමාද වීම හේතුවෙන් 2013 ඔක්තෝබර් 17 දින දක්වා දෙවන වරට දින දීර්ඝ කර තිබුණද, 2014 අප්‍රේල් 24 වන විගණන දින වන විටත් ඉදිකිරීම් නිම කර නොතිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය සැලකීමේදී වියදම රු. මි. 42 ක් වූ බැවින් මූල්‍ය කාර්ය සාධනය සියයට 44.26 ක් ද , භෞතික කාර්ය සාධනය සියයට 70 ක් ද විය.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව සැසඳීමේදී පුරප්පාඩු 55 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 04 ක් විය.

(ආ) අනුමත සේවක සංඛ්‍යාවේ ඇතුළත් නොවූ " ආදර්ශ රූප සේවක" තනතුර සඳහා දෘශ්‍ය කලා අධ්‍යයන පීඨයේ අවශ්‍යතා සඳහා වාර්ෂික ගිවිසුම් මත කොන්ත්‍රාත් පදනමින් සේවකයින් බඳවාගෙන දිගින් දිගටම වැටුප් හා දීමනා ගෙවා ඇති අතර සමාලෝචිත වර්ෂයේ සේවකයින් 08 දෙනෙකු සඳහා එකතුව රු.1,341,800/- ක් වූ වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

විශ්වවිද්‍යාලය විසින් 2013 වර්ෂය සඳහා සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන අරමුණු 07 ක් දක්වා තිබුණ අතර එහි ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 1,333 ක් විය. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානයේදී අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදි සියයට 50 සිට සියයට 2,058 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාල උපකුලපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) කොන්ත්‍රාත් පාලනය
(ඇ) තොග පාලනය
(ඉ) මුදල් හා බැංකු
(ඊ) පුස්තකාල පොත්
(උ) ප්‍රසම්පාදනය